**ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත්කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 02 - අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 31 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.3 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(ආ) | වියදම් හා රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු වීම. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.3 |
| 127 (4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධි වූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | අයවැය අස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.2 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 සැලසුම් කිරීම

**තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

වසර 2015 සැප්තැම්බර් මස එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සාමාජික රටවල් පලකල එකඟතාවය ප්‍රකාරව වසර 2030 වනවිට සෑම සාමාජික රටක් විසින්ම ළඟා කර ගත යුතු අරමුණු සහ ඉලක්ක ඇතුළත් තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය එළි දක්වා ඇත. මෙම න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත්ව අදාළ සුදුසු ඉදිරි පියවර ගෙන නොතිබුණි.

### 2.2 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අග්‍රාමාත්‍ය කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා සමාලෝචන වර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 236.33 | 230.44 | 5.88 | 2.5 |
| | මූලධන | 96.40 | 72.93 | 23.47 | 24 |
| | **එකතුව** | **332.73** | **303.37** | **29.35** | **09** |
| 2014 | පුනරාවර්තන | 269.36 | 269.09 | 0.27 | 0.1 |
| | මූලධන | 65.91 | 52.30 | 13.61 | 21.64 |
| | **එකතුව** | **335.27** | **321.39** | **13.88** | **4.1** |
| 2015 | පුනරාවර්තන | 483.19 | 470.27 | 12.92 | 2.67 |
| | මූලධන | 136.31 | 75.54 | 60.77 | 44.58 |
| | **එකතුව** | **619.50** | **545.81** | **73.69** | **11.90** |
| 2016 | පුනරාවර්තන | 878.27 | 754.69 | 123.57 | 14.07 |
| | මූලධන | 495.93 | 414.46 | 81.48 | 16.43 |
| | **එකතුව** | **1374.20** | **1169.15** | **205.05** | **15.0** |
| 2017 | පුනරාවර්තන | 912.88 | 855.30 | 57.57 | 6.31 |
| | මූලධන | 576.67 | 523.42 | 53.24 | 9.23 |
| | **එකතුව** | **1489.54** | **1378.73** | **110.82** | **7.44** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

---

වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 2.004 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම

---

වැය විෂයයන් 25 ක් සඳහා එකතු ව රු. මිලියන 111.35 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 64.88 පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ප්‍රතිපාදන ඉතිරිය, සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(iii) වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

---

වෙනත් අමාත්‍යාංශ 02 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 4.05 ක් හා රු. මිලියන 1.30 ක් වශයෙන් එකතුව රු. මිලියන 5.35 ක් ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3.22 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 2.14 ක් හෙවත් සියයට 40 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.3 මානව සම්පත් කළමනාකරණය

---

**අනුයුක්ත කාර්ය මණ්ඩලය,තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

---

අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 257.91 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වාර්ෂික වියදම රු. 826,649 ක් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 44 | 32 | 12 |
| තෘතියික මට්ටම | 07 | 03 | 04 |
| ද්විතියික මට්ටම | 187 | 134 | 53 |
| ප්‍රාථමික මට්ටම | 164 | 113 | 51 |
| වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 55 | 30 | 25 |
| එකතුව | 457 | 312 | 145 |